කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2021

2024 - අගෝස්තු

**BCOM E 4045 - සංවර්ධන ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : (පහයි ) 05 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

අ. සංවර්ධන ආර්ථිකයක ස්වභාවය කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ. ශ්‍රී ලංකාව සංවර්ධිත ආර්ථිකයක් ලෙසට පත්වීම උදෙසා ලගාකරගතයුතු අරමුණු මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ. "ඵලදායි ප්‍රතිපත්ති ජාතික ප්‍රතිඵල අනුව පමණක් නොව ගෝලීය පාරිසරික සහ සමාජ ආර්ථික බලපෑම් අනුවද වෙළඳාම් කටයුතු සහ තිරසාර සංවර්ධනය පිළිබඳවද සලකා බැලිය යුතුය." ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය අභිමුඛ ප්‍රතිපත්ති තිරසාර සංවර්ධන අභිමතාර්ථ පදනම් කරගෙන ගොඩනැගී ඇති ආකාරය ඉහත ප්‍රකාශයද යොදාගනිමින් සාකච්ඡා කරන්න .

(ලකුණු 12 යි)

(මුළු ලකුණු 25 යි)

**ප්‍රශ්න අංක - 02**

අ. වර්ධන න්‍යාය මත තාක්ෂණයේ බලපෑම කෙසේ පවතීද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ. Harod Domar ආකෘතිය මගින් යෝජනා කරන ආයෝජන වැඩි කිරීමෙන් සංවර්ධන ලගාකරගන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ. ජාත්‍යන්තර යැපුම් විප්ලවය සහ වෙළඳපොල මූලධර්ම වාදයේ සංකල්ප වර්තමාන ශ්‍රීලංකාවේ කුමන ආර්ථික තත්වයන් තුල දැකගත හැකිදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)

(මුළු ලකුණු 25 යි)

**ප්‍රශ්න අංක - 03**

"සංවර්ධනයට විශාලතම බලපෑමක් කිරීමට නම්, සමාජයක් එහි කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ආයෝජනය කළ යුතුය".

අ. සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනික ස්ත්‍රී පුරුෂ පරතරය නැති කළ යුත්තේ මන්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 05 යි)

ආ. වර්තමානය ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය පිළිබඳව ඇති දත්ත භාවිතයෙන් සංවර්ධිත ආර්ථිකයකට එය කෙසේ වියයුතු දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ. සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි කාන්තාවන් ව්‍යවසකත්වයට දායක වියයුතු ආකාරය සහ එම ව්‍යාපාර ජාත්‍යන්තරකරණය කිරීමට ඩිජිටල් තාක්‍ෂණයේ දායකත්වය කෙසේ ලබාගත හැකිදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 12 යි)
(මුළු ලකුණු 25 යි)

**ප්‍රශ්න අංක - 04**

අ. නිරපේක්ෂ දරිද්‍රතාවය මනින ආකාර දෙකක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 05 යි)

ආ. සංවර්ධන ආර්ථික විද්‍යාවට අනුව අදායම් අසමානතාවය මැනීම සිදුවන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ. සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි දිළිඳුකම අඩු කිරීමට සහ ආදායම් අසමානතාවයට අධ්‍යාපන ශේෂ්ත්‍රය දියුණු කිරීම මගින් ගතහැකි ක්‍රියාමාර්ග මොනවාදැයි උදාහරන සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 12 යි)
(මුළු ලකුණු 25 යි)

**ප්‍රශ්න අංක - 05**

අ. සමාජ ප්‍රතිලාභ සහ සමාජ පිරිවැය යන සංකල්ප සංවර්ධන ආර්ථිකයක කෙසේ හඳුනාගනී දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ. ශ්‍රී ලංකාවේ ජනග්‍රහණය නාගරිකකරණය වීම සඳහා නැඹුරුවී ඇති ආකාරය දත්ත සහිතව පහදන්න.

(ලකුණු 08 යි)

ඇ. "විද්‍යාඥයන් පවසන ආකාරයට කෘතිම බුද්ධියේ (Artificial Intelligence) පිබිදීම කාර්මික විප්ලවයේ නව අවධියක් පෙන්නුම් කරනුයේ, යන්ත්‍ර සිතන, ඉගෙන ගන්නා, ස්වයංප්‍රතිනිර්මාණය කරන සහ කලක් මිනිසුන් සඳහා වෙන් කර තිබූ බොහෝ කාර්යන් ප්‍රගුණ කළ හැකි ලෙස පරිවර්තනය වී ඇත." ශ්‍රී ලංකීය කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට මෙය කෙසේ දායක කරගත හැකිදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)
(මුළු ලකුණු 25 යි)